ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01**

I. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ මිණුම්කරණ පදනම හෙළිදරව් කර නොතිබුණි.

II. 138 වන වගන්තිය ප්‍රකාරව වෙනත් අවශ්‍යතාවයන් හෙළිදරව්කළ යුතු වුවද පහත සඳහන් තොරතුරු හෙළිදරව්කර නොතිබුණි.
   (i) ලියාපදිංචි කළ කාර්යාලයේ හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය
   (ii) සංස්ථාවේ මෙහෙයුම් හා ප්‍රධාන කාර්යයන්

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

පිරිවැය වෙනවෙනම ගණනයකර තොග අගය කිරීම වෙනුවට, සියළුම නිෂ්පාදනවල සාමාන්‍ය පිරිවැය අනුව තොග අගය කර තිබුණු බැවින් කජු ආශ්‍රිත නිෂ්පාදනයන් වෙළඳපලේ මිල සාමාන්‍ය පිරිවැයට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10**

17 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය මූල්‍ය ප්‍රකාශන භාවිත කරන්නන්ට වැදගත් වන බැවින් මූල්‍ය ප්‍රකාශන අනුමත කළ දිනය හෙළිදරව් කළ යුතු වුවද සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කළ දිනය හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

I. සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති මෝටර් වාහන 19 ක තවදුරටත් භාවිතයේ පවත්නා බැවින් එහි සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

II. දේපල, පිරියත සහ උපකරණවලට අදාලව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සමුච්චිත ක්ෂය සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය සහ අපහරණය කරන ලද වත්කම් වල ක්ෂයවීම හෙළිදරව් කර නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතිය ප්‍රකාරව සේවක ප්‍රතිලාභ පිළිබඳ හෙළිදරව් කල යුතු අවශ්‍යතාවයන් නිසිපරිදි හෙළිදරව් කර නොතිබුණි.

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37**

මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කළ යුතු වුවද සංස්ථාවේ සේවයේ නියුතුව සිටි නිලධාරින් දෙදෙනෙකු විසින් සංස්ථාවට එරෙහිව වන්දි ඉල්ලා නඩු පවරා තිබුණද ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

**(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41**

සංස්ථාව සතු කජු ගස් ජෛව විද්‍යාත්මක වත්කම් වන අතර එම වත්කම් ප්‍රමිතිය ප්‍රකාරව සාධාරණ අගයට ගිණුම්ගත කර නොතිබූ අතර පහත සඳහන් හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

I. කෘෂිකාර්මික කටයුතුවලට අදාල මූල්‍ය අවදානම උපාය මාර්ග
II. සෑම ජෛව විද්‍යාත්මක වත්කම් කාණ්ඩ සහ කාර්යයන් වල ස්වභාවය
III. සෑම ජෛව විද්‍යාත්මක වත්කමක භෞතික ප්‍රමාණයන් හා කාල පරිච්ඡේදය තුළදී ලබාගත් ඵලදාවට අදාල මූල්‍ය නොවන මිනුම් පෙර ඇස්තමේන්තු

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය රු.43,968 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල රු.364,664 ක් වියදම් උපචිත වියදම් වශයෙන් ගිණුම් ගත කර නොතිබුණු අතර නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ 2015 සැප්තැම්බර් මාසයේ මිලදීගත් රු.53,000 ක් වටිනා විද්‍යාගාර උපකරණ සඳහා ගෙවිය යුතු මුදල ණය හිමියන් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) (i) 2005 අප්‍රේල් 08 දින කෘෂිකර්ම අලෙවි සංවර්ධන සමුපකාර සංවර්ධන හින්දු ආගමික කටයුතු හා සහායක අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයෙන් සියයට 6 වාර්ෂික පොලියට ලබා ගන්නා ලද රු.3,500,000 ක ණය මුදලක් දිගු කාලීන ණය යටතේ දැක්වීමට කටයුතු නොකර ජංගම වගකීම් යටතේ ගිණුම් වල දක්වා තිබුණි.

(ii) එම ණය මුදල සඳහා සමාලෝචිත වර්ෂයට ගෙවිය යුතු පොලිය රු.210,000 ක් සඳහා වෙන් කිරීමක් කර නොතිබුණු අතර 2015 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු වූ පොලිය රු.2,240,000 ක් ජංගම වගකීම් ලෙස දක්වා නොතිබුණි.

(ඈ) අස්වනු රක්ෂණය වෙනුවෙන් (Crop Insurance ) ගෙවිය යුතුව තිබූ රු.791,465 ක මුදල දිගු කාලීන වගකීම් යටතේ දැක්වීම වෙනුවට ජංගම වගකීම් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

(ඉ) මිහින්තලේ වාණිජ පැල තවානේ ඉදිකරන ලද වගා ළිඳෙහි සම්පූර්ණ වටිනාකම රු.517,507 ක් වුවද ස්ථාවර වත්කම් යටතේ එහි වටිනාකම රු.465,756 ක් ලෙස දක්වා තිබීමෙන් ස්ථාවර වත්කම් රු.51,751 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට හා කළමණාකරන තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශිය ආදායම් බදු පනත | සංස්ථාව ආදායම් බදු බැදියාවට යටත් සංස්ථාවක් වන නමුත් 2011/2012, 2012/2013, 2013/2014 හා 2014/2015 තක්සේරු වර්ෂ වල ආදායම් බදු ප්‍රකාශන සකස් කිරීමට හෝ ආදායම් බදු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | තොග සහ සිල්ලර භාණ්ඩ සපයන හා භාණ්ඩවල නිෂ්පාදන ආයතනය වන විටදී සහ කාර්තුවක පිරිවැටුම රු. මිලියන 3 කට වැඩි හෝ වාර්ෂික පිරිවැටුම රු. මිලියන 12 කට වැඩි වන විටදී එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි වියයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.5 වගන්තිය | ආපදා ණය ගෙවීමේදී ණය කරුවන් හා ඇපකරුවන්ගේ වැටුපෙන් 40% අවකරණ සීමාව ඉක්මවා ණය ගෙවීම් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඈ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතව අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් පාලක මණ්ඩලයේ අනුමැතිය මත සේවකයින්ට ගෙවිය හැකි වුවත් ඊට පටහැනි ලෙස සංස්ථාවේ කළමනාකරණ මට්ටමේ නිලධාරින්ට මසකට රු.5,000 බැගින් හා අනෙකුත් සේවකයෙකුට රු.1500 බැගින් සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් දක්වා ප්‍රවාහන දීමනා ලෙස රු.2,368,801 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන ඡේදය | චක්‍රලේඛයේ වාහන පැවරීම හා විකුණුම් ආදායම පිළිබඳ උපදෙස්වල දක්වා ඇති පරිදි වාහන විකුණුම් ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාවේ වාහන විකිණීමෙන් ලද රු.5,306,351 ක ආදායම භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වලින් රු.47,728,042 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.26,057,641 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදි ඌනතාවය රු.21,670,401 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. වාණිජ අංශයේ විකුණුම් ආදායම රු.40,073,524 කින් අඩුවීම හා කජු ව්‍යාපෘති සේවයේ වියදම රු.9,254,364 ක් හා පැල තවාන් වියදම රු.12,114,885 කින් වැඩිවීම මෙම ඌණතාවයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී , මූල්‍ය ප්‍රතිඵලය 2012 වර්ෂයේදී රු.44,233,832 ශුද්ධ ලාභයක් වුවද එය අඛණ්ඩව පිරිහෙමින් 2015 වර්ෂයේදී රු.47,728,042 ක ශුද්ධ අලාභයක් වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික හා ක්ෂයවීම්

සැලකිල්ලට ගැනීමේදී 2012 වර්ෂයේදී රු.100,906,166 ක දායකත්වයක් පැවතියද 2015 වර්ෂයේදී එය රු.41,851,749 ක් දක්වා සියයට 141 කින් අඩුවී තිබුණි.

(ඇ) ආයතනයේ සේවක පාරිශ්‍රමික සඳහා ගෙවීම 2012 වර්ෂයේදී රු.45,592,055 ක් වුවද එය සමාලෝචිත වර්ෂයේදී රු.71,884,727 ක් වුයෙන් සියයට 57 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) මෙහෙයුම් ක්‍රියාකාරිත්වය

I. සංස්ථාවේ 2015 වර්ෂයේ වාණිජ අංශයේ දළ ලාභ අනුපාතය සියයට 27 ක් වුවද 2014 වර්ෂයේ එය සියයට 46 ක් වුයෙන් 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 19 ක අඩු වීමක් නිරීක්ෂණය විය.

II. කජු ආශ්‍රිත නිෂ්පාදනවල 2011 සිට 2014 දක්වා විකුණුම් ආදායම සමග සංසන්දනයේදී 2015 වර්ෂයේ විකුණුම් ආදායම අඩුවීමක් නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනත අනුව සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වුයේ කජු වගා කිරීමේ හා නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම සහ මිළදී ගැනීම, අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම, විමර්ෂණය හා පර්යේෂණ කටයුතු කිරීම, අලෙවි කිරීම පිළිබඳ හා වෙනත් තොරතුරු රැස්කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම හා බෙදාහැරීම, කජු ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම් හා ලෝකයේ වෙළඳපලවල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම වේ. එහෙත් අරමුණු ළඟා කර ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කජු ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා හා කජු නිෂ්පාදන සඳහා ලෝකයේ වෙළඳපල ප්‍රවර්ධනය කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) කජු වගා කිරීම

(i) පුත්තලම කජු වතුයායට අක්කර 960 ක භූමි ප්‍රමාණයක් හිමිව තිබුණත් ඉන් වගාවට යොදා තිබුණේ අක්කර 240 බැවින් අක්කර 720 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii) පුත්තලම, කමන්දළුව හා හාඩි වතුයායවල කජු ගස් වසර 30 ඉක්මවු බැවින් එලදාව අවම මට්ටමක පැවතුණි.

(ඇ) සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

කජු ව්‍යාප්ත කිරීම සඳහා සහනාධාර ක්‍රමය යටතේ 2014 සහ 2015 වර්ෂවල බද්ධ කජු පැල 200,000 ක් හා බීජ කජු පැල 80,000 ක් බැගින් පැල 560,000 ක් ගොවීන් අතර බෙදා දී තිබුණි. මේ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේ පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් සඳහා රු.2,054,400 ක්ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් සඳහා රු.2,152,800 ක් වැය කර බද්ධ කජු පැල පිළිවෙලින් 34,240 ක් හා 36,000 ක් බෙදා තිබුණි. පුත්තලම දිස්ත්‍රික්කයේ කජු පැල 22,204 ක් එනම් 65% ක් හා කුරුණෑගල

දිස්ත්‍රික්කයේ කජු පැල 13,027 එනම් 36 % විනාශ වී තිබීම නිසා අපේක්ෂිත ඉලක්ක සපුරාගෙන නොතිබුණු බව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) 2014 වර්ෂයේ බෙදා දුන් කජු පැල 280,000 න් කජු පැල 130,303 ක් පමණක් පැලවී තිබූ බව නිරීක්ෂණය වූයෙන් සහනාධාර කජු ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iii) 2014 වර්ෂයේ සහනාධාර යටතේ අක්කර 4500 ක් සඳහා කජු පැල ලබාදී තිබුණු අතර අක්කර 422 ක එකම කජු පැලයක්වත් නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ හා සංවර්ධනය

---

සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා රු.මිලියන 3 ක් වෙන් කර තිබුණු අතර එයින් රු.මිලියන 2.894 ක් වැය කර තිබුණි. ක්‍රියාත්මක වූ පර්යේෂණ වැඩසටහන් පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පර්යේෂණ සිදු කිරීමට පෙර පර්යේෂණ යෝජනාවලියක් ඉදිරිපත් කර අනුමත කරගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) පර්යේෂණවල ප්‍රගතිය ඇගයීම් කළ හැකි පරිදි අඛණ්ඩ හා විධිමත් ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර මාසිකව කළ වැඩ වාර්තාවක ස්වරූපයට ප්‍රගති වාර්තා ඉදිරිපත් කර තිබුණි.

## 4.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව සඳහා මූල්‍ය රෙගුලාසි හා පරිපාලන රීති මාලාවක් සකස් කර නොතිබුණු අතර සේවක පැමිණීම, පිටවීම හා කාර්යාල වේලාවන් සඳහා ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුවද අතිකාල දීමනා ගෙවීම සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධාන අනුවද වාසිදායක පරිදි යොදාගෙන තිබුණි.

(ආ) අක්කර 15,329 ක් වූ වතු 9 ක සංස්ථාව කජු වගා කර තිබුණද එම වතුවලින් අක්කර 200 ක වත්තක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටද, අක්කර 1874 ක වතු 3 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවටද, අක්කර 13,255 ක වතු 5 ක් රජයටද අයත් ඒවා වන අතර එම ඉඩම් සංස්ථාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 සහ 2013 වර්ෂවලදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම වැඩසටහනට සංස්ථාව විසින් ලබාදුන් කජු පැල සඳහා රු.9,466,200 ක් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව ඇතත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නමින් අමාත්‍යාංශයක් මේ වනවිට නොමැති බැවින් මුදල් අයකර ගැනීම ගැටළු සහගත වන අතර එම කාලවකවානුව තුල මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

# 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

---

## 5.1 වාර්ෂික වාර්තා

---

සංස්ථාවේ 2013 සහ 2014 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණු අතර 2015 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/PE/21 හා 2002 මැයි 24 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 අයවැය පාලනය

I. අදාළ වර්ෂයේ අයවැය සංඛ්‍යා හා පසුගිය වර්ෂයේ තත්‍ය වියදම් සමඟ සමාලෝචනය කළ හැකි වන පරිදි අයවැය ලේඛණය පිළියෙළ කළයුතු වුවත් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ අයවැය ලේඛණයේ පසුගිය වර්ෂයේ තත්‍ය වියදම ඉදිරිපත් කර නොතිබුණි.

II. සමාලෝචිත වර්ෂයේ අයවැයගත අයිතම 26 ක වියදම් හා තථ්‍ය වියදම් අතර 20% සිට 1102% දක්වා විචලනයක් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයා වෙත යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) සේවක පරිපාලනය

සංස්ථාව සඳහා මූල්‍ය හා පරිපාලන රීති මාලාවක් සකස් කර නොතිබූ අතර සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීම අනුමත පරිපාටියෙන් බැහැරව සිදුකර තිබුණි.

(ආ) අයවැය පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද විධිමත් අයවැය ලේඛණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වත්කම් පාලනය

කජු වතුවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) මූල්‍ය පාලනය

සංස්ථාවේ කජුපැල අලෙවියෙන් ලැබිය යුතු ණය මුදල් එම කාලවකවානුව තුල අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.